# දේශපාලනයෙහි සහ මාධ්‍ය තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය නිමා කිරීම පිණිස නව සංධානයන් සඳහා සහයෝගය ලබාදීම

## වැඩසටහනේ සාරාංශය:

දේශපාලනය සහ මාධ්‍ය තුළ කාන්තාවන්ට ස්වකීය සහභාගීත්වය තහවුරු කිරීමේ හැකියාව සඳහා සෘජුවම බලපාන ලබන්නා වූත් අන්තර්කරණයෙන් යුත් ප්‍රජාතන්ත්‍රවාදයන් සහ ආයතනයන් සම්බන්ධයෙන් ඉතා ප්‍රබල බාධකයක් වශයෙන් පවතින්නා වූත් එක් කරුණක් වන්නේ ප්‍රචණ්ඩත්වය හෝ ප්‍රචණ්ඩත්වය සඳහා ඇති තර්ජනයයි. දේශපාලනය සහ මාධ්‍ය තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය යන්නට ඔවුන් කාන්තාවන් වීම හේතුවෙන්ම ඔවුන්ට මුහුණ දීමට සිදුවන්නා වූ ශාරීරික සහ මාර්ගගත ක්‍රම ඔස්සේ සිදුවන සියලුම ආකාරයෙහි ආක්‍රමණශීලී ක්‍රියා, හිරිහැර කිරීම්, බලහත්කාරකම් සහ බියවැද්දීම් ආදී සියල්ල අන්තර්ගත වේ. දේශපාලනයෙහි සහ මාධ්‍ය තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සාමාන්‍යයෙන් පුද්ගලිකව කාන්තාවන්ට සිදු වන නමුදු එසේ සිදු කිරීමෙන් පුළුල් වශයෙන් අරමුණු කරනු ලබන්නේ දැනටමත් දේශපාලනයෙහි සහ මාධ්‍ය තුළ ක්‍රියාකාරීව සිටින අනෙකුත් කාන්තාවන් ද බියට පත්කිරීම මෙන්ම එකී ක්ෂේත්‍රයන් තුළ ස්වකීය වෘත්තිය කටයුතු පවත්වාගෙන යෑමට අපේක්ෂා කරනු ලබන කාන්තාවන් එයින් වලක්වාලීම සහ කාන්තාවන් කිසිදු අයුරකින් පොදු සමාජීය ජීවිතය තුළ කිසිදු ධාරිතාවයකින් ස්වකීය සහභාගීත්වය ලබා නොදිය යුතුය, යන පණිවිඩය සමාජය වෙත සන්නිවේදනය කිරීම ආදී අරමුණු සඳහායි. මෙය වූ කලී ගෝලීය ප්‍රශ්නයක් වන අතර කෝවිඩ්-19 වසංගත තත්ත්වය මගින් ඉහත කී ප්‍රශ්නය තවදුරටත් වඩා වැඩි සංකීර්ණ තත්ත්වයකට පත්කිරීම පමණක් සිදුව තිබේ.

ඉහත කී අභියෝගයන් ජය ගැනීම උදෙසා අන්තර්ජාතික කටයුතු සඳහා වන ජාතික ප්‍රජාතාන්ත්‍රික ආයතනය (National Democratic Institute for International Affairs-NDI) සහ අන්තර්ජාතික කාන්තා මාධ්‍ය පදනම (International Women's Media Foundation - IWMF) ඒකාබද්ධව වැඩසටහනක් නිර්මාණය කර ඇති අතර, එමගින් දේශපාලනයෙහි සහ මාධ්‍ය යන ක්ෂේත්‍රයන්හි සිටින කාන්තාවන් ඒකරාශී කරගෙන එකී ක්ෂේත්‍රයන්හි කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිටු දැකීමට කටයුතු කෙරේ. මෙකී වැඩසටහන සඳහා:

1. වර්ෂ 2020 සිට 2022 දක්වා වූ දෙවසරක කාලය තුළ මාර්ගගත වැඩමුළු ගණනාවක් (සමස්තයක් වශයෙන් පැය 90) පැවැත්වීම. මෙකී වැඩසටහන සාර්ථකව නිමා කරනු ලබන සහභාගීවන්නන් හට එය අවසානයේදී සහතික පත්‍රයක් ලැබෙනු ඇත.

2. මෙම වැඩසටහන තුළදී තෝරාගත් සහභාගීවන්නන් සඳහා පහත සඳහන් ක්ෂේත්‍රයන් සඳහා ප්‍රවේශ පහසුකම් හිමිවේ.

අ. මෙකී ක්ෂේත්‍ර ද්විත්වයෙහිම දේශපාලනිකව ක්‍රියාකාරී කාන්තාවන් සඳහා ආරක්ෂක සැලසුම් මෙවලම්, මාර්ගගත ආරක්ෂක මෙවලම් සඳහා;

ආ. මාධ්‍ය ක්ෂේත්‍රයන්හි සහ දේශපාලනික වශයෙන් ක්‍රියාකාරී කාන්තාවන් සඳහා සතුරු වටපිටාවක් තුළ කටයුතු කිරීම සහ ප්‍රථමාධාර පිළිබඳ පුහුණුව;

ඇ. මාධ්‍ය ආයතන, ව්‍යවස්ථා සම්පාදකයන් සහ දේශපාලන පක්ෂ ඉලක්ක කරගත් උද්දේශන කටයුතු වල නිරත කාන්තාවන්ට සහයෝගය දැක්වීම සඳහා අවැසි මෙවලම් ගණනාවක් සඳහා ප්‍රවේශය සහ ඒවා පිළිබඳ පුහුණුව;

ඇ. දේශපාලනයෙහි සහ මාධ්‍ය තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ මහජන දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා සකසන ලද ව්‍යාපාරයන්ට ප්‍රවේශය සහ ඒවා පිළිබඳ පුහුණුව.

3. මීට අමතරව, දේශපාලනය සහ මාධ්‍ය තුළ කාන්තාවන්ට සිදු වන ප්‍රචණ්ඩත්වය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා දෙමසකට වරක් මාර්ගගත රැස්වීමකට සහභාගි වීමේ අවස්ථාවත් මෙකී වැඩසටහනට සහභාගී වන්නන්ට ලැබෙන අතර, එහිදී කාන්තාවන්ගේ දේශපාලනික සහභාගිත්වය සම්බන්ධයෙන් පවතින කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයෙහි ඍණාත්මක බලපෑම් සමනය කිරීම උදෙසා අවැසි උද්දේශන උපායමාර්ගයන් හෝ ව්‍යාපාරයන් සැලසුම් කිරීම සඳහා අවස්ථාව ලැබීම ආදී වශයෙන් වූ අංගයන් ඇතුළත් වේ.

මෙකී වැඩසටහන සඳහා ඉල්ලුම්පත් යොමු කිරීමේ අවසන් දිනය වර්ෂ 2020 සැප්තැම්බර් මස 20 වන දින වේ. සියලුම ඉල්ලුම්පත්‍ර අන්තර්ජාතික කාන්තා මාධ්‍ය පදනමෙහි (International Women's Media Foundation - IWMF) ආරක්ෂිත මාර්ගගත අයදුම්පත්‍රය හරහා බාරගනු ලැබේ. අයදුම් පත්‍රයෙහි පිටපතක් භාගත කර ගැනීම here ඔස්සේ සිදුකල හැකි අතර gender@ndi.org විද්‍යුත් තැපැල් ලිපිනය හරහා ද අදාල අයදුම්පත්‍ර යොමු කළ හැකිය. වැඩිදුර විස්තර සඳහා අපගේ website වෙබ් අඩවියට පිවිසෙන්න.

**සුදුසුකම්:**

මෙම වැඩසටහනට සහභාගි වීම සඳහා ඔබට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුවේ.

- කාන්තාවක් වශයෙන් හඳුනාගැනීම.
- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
- වයස අවුරුදු 18 හෝ ඊට වැඩි වීම.
- දේශපාලනික වශයෙන් හෝ මාධ්‍ය තුළ ක්‍රියාකාරී කාන්තාවක් වීම.

කරුණාකර අදාල ක්ෂේත්‍ර ද්විත්වය සඳහා පහත සඳහන් කර ඇති තොරතුරු වෙත අවධානය යොමු කරන්න.

කාන්තාවක් වශයෙන් හඳුනා ගනු ලබන්නා වූ එනම්, සංක්‍රාන්තික ලිංගික තත්ත්වයෙහි සිටින කාන්තාවන් සහ ද්වි ලිංගික නොවන තැනැත්තන් (ශාරීරිකව හිමි ලිංගභේදයට පටහැනි) ද ඇතුළුව සියලුම තැනැත්තන් මෙම වැඩසටහනට ඇතුළත් වේ.

**ක්ෂේත්‍රය අනුව සුදුසුකම් පිළිබඳ තොරතුරු:**

**කරුණාකර පහතින් සඳහන් ක්ෂේත්‍ර දෙකෙන් එකක් තෝරාගන්න.**

1. ***දේශපාලනයෙහි නිරත කාන්තාවන් :*** ඔබ පසුගිය වසර දෙකක කාලය තුළ දේශපාලනිකව ක්‍රියාකාරීව සිටි කාන්තාවක් බව ඔබ විසින්ම හඳුනා ගත යුතුය. "දේශපාලනික වශයෙන් ක්‍රියාකාරී" යන්නෙන් මෙම වැඩසටහන තුළ නිර්වචනය කරනු ලබන්නේ, වෘත්තිය වශයෙන් හෝ ස්වේච්ඡා පදනම මත කාන්තාවක් වශයෙන් පහත සඳහන් එක් ක්ෂේත්‍රයක හෝ කටයුතු කර තිබෙන ඕනෑම කාන්තාවක් යඃ

- ○ සිවිල් සමාජය - ලාභ නොලබන, රාජ්‍ය නොවන සංවිධාන, අන්තර්ජාතික සංවිධාන, ප්‍රජාමූල සංවිධාන සහ ග්‍රාමීය වශයෙන් ඇති කුඩා සංවිධාන ආදී වශයෙන් වූ ආයතනයක ඕනෑම සාමාජිකාවක,
- ○ ජාතික තලයේ දේශපාලනය (තනතුරක් දරන නිලධාරියෙකු, අපේක්ෂකයෙකු, දේශපාලන පක්ෂ සාමාජිකයෙකු හෝ මැතිවරණ නිලධාරියෙකු/ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු)
- ○ පළාත් දේශපාලනය (තනතුරක් දරන නිලධාරියෙකු, අපේක්ෂකයෙකු, දේශපාලන පක්ෂ සාමාජිකයෙකු හෝ මැතිවරණ නිලධාරියෙකු/ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු)
- ○ නාගරික දේශපාලනය (තනතුරක් දරන නිලධාරියෙකු, අපේක්ෂකයෙකු, දේශපාලන පක්ෂ සාමාජිකයෙකු හෝ මැතිවරණ නිලධාරියෙකු/ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු)

**ඔබ ඔබගේ දේශපාලන ක්‍රියාකාරකම් පැහැදිලි කරනු ලබන්නේ කෙසේද? පහත සඳහන් කවර කරුණකින් ඔබගේ භූමිකාව වඩා නිවැරැදිව පැහැදිලි කරනු ලබන්නේ ද?**

- තෝරා පත් කරගත් නිලධරයෙකු (ජාතික, පළාත් හෝ නාගරික / පළාත් පාලන)
- මැතිවරණ නිලධරයෙකු / සේවකයෙකු
- දේශපාලන අපේක්ෂකයෙකු
- දේශපාලන ක්‍රියාකාරියෙකු හෝ සංවිධායකවරයෙකු
- සිවිල් සමාජ සාමාජිකයෙකු

***2. මාධ්‍ය තුළ කාන්තාවන් :*** ප්‍රවෘත්ති මාධ්‍ය තුළ වසර දෙකක් හෝ ඊට වැඩි වෘත්තීය අත්දැකීමක් සහිතව මාධ්‍ය ආයතනයකට සම්බන්ධව හෝ ස්වාධීන මාධ්‍යවේදියෙකු වශයෙන් කටයුතු කරනු ලබන අයෙකු විය යුතුය.

ආධුනිකත්ව හෝ විශ්වවිද්‍යාල ශිෂ්‍ය තත්ත්වය තුළ මාධ්‍යකරණයට අදාළව සිදු කර ඇති කටයුතු වෘත්තීය සුදුසුකම් වශයෙන් සලකනු නොලැබේ.

**මම (මින් එකක් තෝරන්න)**

- වීඩියෝ මාධ්‍යවේදිනියකි
- ඡායාරූප මාධ්‍යවේදිනියකි
- මුද්‍රිත මාධ්‍යවේදිනියකි
- බහුමාධ්‍ය මාධ්‍යවේදිනියකි
- විකාශන මාධ්‍යවේදිනියකි
- ගුවන්විදුලි මාධ්‍යවේදිනියකි
- වෙනත් ( උදාඃ බ්ලොග් අඩවියක් පවත්වාගෙන යන තැනැත්තියක)

**ඔබ ස්වාධීන හෝ මාධ්‍ය ආයතනයක කාර්ය මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් සේවය කරන්නේ ද?**

- ස්වාධීන මාධ්‍යවේදිනියකි
    - වැඩි වශයෙන් ඔබගේ මාධ්‍ය කටයුතු පළ කෙරෙන මාධ්‍ය ආයතන මොනවාද?
- මාධ්‍යවේදී කාර්යමණ්ඩල සාමාජිකාවකි,
    - ඔබ සේවාව සපයන මාධ්‍ය ආයතන ලැයිස්තුගත කරන්න.

*සපයන ලද සියලු තොරතුරු වල උපරිම රහස්‍යභාවය සහ විශ්වසනීයත්වය සුරකිනු ලබන අතර, මෙම අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය අරමුණට පමණක් භාවිතා කරන්නනා සේම, කිසිදු හේතුවක් මත වෙනත් අරමුණකට හෝ වෙනත් පාර්ශවයකට එකී තොරතුරු අනාවරණය කරනු නොලැබේ.*

**පුද්ගලික තොරතුරු:**

- **සම්පූර්ණ නම:**
- **උපන්දිනය: දිනය / මාසය / වසර**
- **දුරකථන අංකය:**
- **විද්‍යුත් තැපෑල:**

- **ඔබ විසින් ඔබව හඳුනාගනු ලබන්නේ කෙසේද? ඔබගේ ජනවාර්ගික පසුබිම කවරෙක්ද?**
    - ශ්‍රී ලාංකික දෙමළ
    - සිංහල
    - ශ්‍රී ලාංකික මුවර්
    - ඉන්දියානු දෙමළ
    - බර්ගර්
    - වෙනත්

- ***වෛකල්පිත:* ඔබට ආගමක් ඇත්නම් ඔබ කවර ආගමකට අයත් යැයි සිතන්නේද?**
    - බුද්ධාගම
    - හින්දු
    - ඉස්ලාම්
    - රෝමානු කතෝලික
    - වෙනත් ක්‍රිස්තියානි
    - වෙනත්

- ඔබගේ තනතුරු නාමය සහ වර්තමාන සේවායෝජකයා :
- ඔබ ස්ථානගතව ඇති නගරය සහ රට :
- චරිතාපදානය :
    - *පහත සඳහන් තොරතුරු ද සමඟින් ඔබගේ චරිතාපදානය (Biography) වචන 300 කට වැඩි නොවන සේ කරුණාකර ඉදිරිපත් කරන්න.*

        - ඔබගේ අවධානය යොමු කරනු ලබන ප්‍රශ්නගත කාරණයෙහි කේන්ද්‍රීය සාධකය (සහ එය කවර තලයකට අයත් ද යන්න. (පළාත් පාලන, ජාතික හෝ ජාත්‍යන්තර)

- මෙම වැඩසටහනට අයදුම් කිරීම සඳහා පදනම් වූ හේතු පැහැදිලි කිරීම. ඔබගේ වෘත්තිය ඉතිරි ගමන තුළ මෙම වැඩසටහන සහභාගි වීමට සුදුසු අවස්ථාව මෙය වන්නේ ඇයි? සහ මෙය ඔබගේ වෘත්තීය ඉදිරි ගමනට කෙසේ ප්‍රයෝජනවත් වේද?
- හදිසි තත්ත්වයන්හිදී සතුරු වටපිටාවක් තුළ කටයුතු කිරීමේදී ප්‍රථමාධාර ලබා දීම සම්බන්ධයෙන් පුහුණුවක් ලබා තිබේද?
- පිළිතුර ඔව් නම්, එකී පුහුණුව පිළිබඳ සාරාංශයක් සහ එය පැවැත් වූ දින පිළිබඳ තොරතුරු සඳහන් කරන්න.
- ඔබගේ වෘත්තීය ගමන තුල ඔබ විසින් මුහුණ දී ඇති ආරක්ෂාව පිළිබඳ ගැටළු මොනවාද?
- සම්මාන, උපාධි, වෙනත් වෘත්තිය කුසලතා

## වෘත්තීය අත්දැකීම්:

- **කරුණාකර ඔබගේ යාවත්කාලීන කරන ලද ජීව දත්ත සටහන (curriculum vitae) මෙයට අමුණන්න.**
- **ඔබ මාධ්‍ය ආයතනයක සාමාජිකයෙකු නම්, ඒ බව තහවුරු කිරීමේ ලිපියක්:**
    - මාධ්‍යවේදියෙකු වන ඔබ කර්තෘවරයෙකුගේ හෝ නිර්දේශකයෙකුගේ ලිපියක් උඩුගත (Upload) කරන ලෙස අප විසින් නිර්දේශ කරනු ලැබේ.
  - **ඔබ මාධ්‍ය ආයතනයක සාමාජිකයෙකු නම්, පසුගිය වසර දෙකක කාලය තුළ ඔබගේ මාධ්‍යවේදීකරණය තුළ සිදුකළ වැඩ කටයුතු දෙකක උදාහරණ මෙයට අමුණන්න.**
  - පළමු උදාහරණය
  - දෙවන උදාහරණ
- **වෘත්තීය නිර්දේශකයින්:**
  - පළමු නිර්දේශක:
    - සම්පූර්ණ නම:
    - තනතුර සහ ආයතනය:
    - සම්බන්ධතාවය:
    - විද්‍යුත් තැපැල:
    - දුරකථන:
  - දෙවන නිර්දේශක:
    - සම්පූර්ණ නම:
    - තනතුර සහ ආයතනය:
    - සම්බන්ධතාවය:
    - විද්‍යුත් තැපැල:
    - දුරකථන:

- **මෙම අවස්ථාව පිළිබඳව ඔබට දැනගන්නට ලැබුණේ කෙසේද?**

  - ට්විටර්
  - මුහුණු පොත
  - විද්‍යුත් තැපැල
  - අන්තර්ජාතික කාන්තා මාධ්‍ය පදනමෙහි පුවත් සඟරාව
  - වෙනත්: කරුණාකර පැහැදිලි කරන්න.
  - පුද්ගලිකව නිර්දේශ කරන ලදි.

ඔව්! අපගේ ප්‍රශ්න පිළිබඳ පුවත් සහ සිදුවීම් මෙන්ම නව අවස්ථාවන් පිළිබඳ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයෙහි සහ අන්තර්ජාතික කාන්තා මාධ්‍ය පදනමෙහි සන්නිවේදන ලබා ගැනීමට මම කැමතිය.

මේ සමඟ ඉදිරිපත් කරනු ලබන මා විසින් කරන ලද වැඩ කටයුතු මාගේ දැනුම සහ විශ්වාසය අනුව මීට පෙර වෙනත් කිසිවකු විසින් පළ කරන ලද ඒවා නොව මා විසින්ම සිදුකරන ලද වැඩකටයුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

අත්සන ඃ